**පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක 391**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
දසවැනි පාර්ලිමේන්තුව
(පළමුවැනි සභාවාරය)

# පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ පස්වැනි වාර්තාව

(2025.05.08 වැනි දින හා 2025.07.17 වැනි දින ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සම්බන්ධයෙන් සිදු කරන ලද විමර්ශනය)

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සභාපති
පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා විසින්
2025 දෙසැම්බර් මස 18 වැනි දින ඉදිරිපත් කරන ලදී

*2025 දෙසැම්බර් මස 18 වැනි දින ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් මුද්‍රණය කළ යුතු යැයි නියෝග කරන ලදී.*

**<u>දසවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභාවාරය</u>**
**<u>පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සංයුතිය</u>**

1. ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා, පා.ම., (සභාපති)
2. ගරු අර්කම් ඉල්යාස් මහතා,පා.ම., (2025.05.08 දින සිට)
3. ගරු මනෝ ගනේෂන් මහතා, පා.ම., (2025.03.21 දින සිට)
4. ගරු (නීතිඥ) දයාසිරි ජයසේකර මහතා, පා.ම., (2025.05.20 දින සිට)
5. ගරු (නීතිඥ) අර්ජුන සුජීව සේනසිංහ මහතා, පා.ම., (2025.03.21 දින සිට)
6. ගරු ඩී.වී. චානක මහතා, පා.ම., ( 2025.03.21 දින සිට)
7. ගරු (නීතිඥ) අනුරාධ ජයරත්න මහතා, පා.ම., (2025.03.21 දින සිට)
8. ගරු නලීන් බණ්ඩාර ජයමහ මහතා, පා.ම., (2025.03.21 දින සිට)
9. ගර. එස්.එම් මරික්කාර් මහතා, පා.ම., (2025.03.21 දින සිට)
10. ගරු මුජිබුර් රහුමාන් මහතා, පා.ම., (2025.05.20 දින සිට)
11. ගරු චමින්ද විජේසිරි මහතා, පා.ම., (2025.03.21 දින සිට)
12. ගරු අබූබකර් අතම්බාවා මහතා, පා.ම., (2025.05.08 දින සිට)
13. ගරු එම්.කේ.එම්. අස්ලම් මහතා, පා.ම.,
14. ගරු (නීතිඥ) නිලන්ති කොට්ටහච්චි මහත්මිය, පා.ම., (2025.03.21 දින සිට)
15. ගරු සමන්මලී ගුණසිංහ මහත්මිය, පා.ම.,
16. ගරු දිලිත් ජයවීර මහතා, පා.ම., (2025.03.21 දින සිට)
17. ගරු මයිල්වාගනම් ජෙගදීස්වරන් මහතා, පා.ම., (2025.05.08 දින සිට)
18. ගරු සුජීව දිසානායක මහතා, පා.ම.,
19. ගරු සුදත් බලගල්ල මහතා, පා.ම.,
20. ගරු (වෛද්‍ය) එස්. ශ්‍රී බවානන්දරාජා මහතා, පා.ම.,
21. ගරු ලුතිනන් කමාන්ඩර් (විශ්‍රාමික)
    ප්‍රගීත් මධුරංග මහතා, පා.ම., (2025.03.21 දින සිට)
22. ගරු ජගත් මනුවර්ණ මහතා, පා.ම.,
23. ගරු රුවන් මාපලගම මහතා, පා.ම.,
24. ගරු සුනිල් රාජපක්ෂ මහතා, පා.ම.,
25. ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා, පා.ම.,
26. ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා, පා.ම.,
27. ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා, පා.ම., (2025.03.21 දින සිට)
28. ගරු තිළිණ සමරකෝන් මහතා, පා.ම.,
29. ගරු චන්දිම හෙට්ටිආරච්චි මහතා, පා.ම.,
30. ගරු (නීතිඥ) ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය, පා.ම.,
31. ගරු දිනේෂ් හේමන්ත මහතා, පා.ම., (2025.03.21 දින සිට)

**කාරක සභා ලේකම් කාර්යාලයේ කාර්ය මණ්ඩලය**

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ වත්මන් කාර්ය මණ්ඩලය පහත පරිදි වේ.

- ❖ සහකාර අධ්‍යක්ෂ (පරිපාලන) - හිමාලි සමරදිවාකර මෙය
- ❖ ප්‍රධාන නිලධාරි - එච්. රූපානි ද සොයිසා මිය
- ❖ නියෝජ්‍ය ප්‍රධාන නිලධාරි - එස්. එල්. වික්‍රම මයා
- ❖ පාර්ලිමේන්තු නිලධාරි - ජී. වී. එස්. කේ. කුමාරි මිය
- ❖ පාර්ලිමේන්තු නිලධාරි - අයි. එස්. ගෝමස් මිය
- ❖ පාර්ලිමේන්තු නිලධාරි - ජී. එල්. ඩී. ප්‍රනාන්දු මිය

**කාරක සභා වාර්තා**

www.parliament.lk යන වෙබ් අඩවියෙන් පහත සඳහන් ගමන් මාර්ගය ඔස්සේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ වාර්තා බාගත කළ හැක.

www.parliament.lk

↓

සිංහල

↓

පාර්ලිමේන්තුවේ කටයුතු

↓

කාරක සභා

↓

කාරක සභා වාර්තා

## පටුන


| | | පිටු අංක |
|---|---|---|
| 1. | සභාපතිතුමාගේ සටහන | IV |
| 2. | විධායක සාරාංශය | V |
| 3. | මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණන මතය | 01 |
| 4. | පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව මඟින් විමර්ශනය කරන ලද ආයතනය - ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව | 02-20 |

**<u>සභාපතිතුමාගේ සටහන</u>**

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් දසවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභා වාරයේදී 2025.05.08 හා 2025.07.17 යන දෙදින තුළ පරීක්ෂාවට ලක් කළ **කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය යටතේ ඇති ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ** 2022 සහ 2023 වර්ෂයන්ට අදාළ විගණකාධිපති වාර්තා හා වර්තමාන කාර්යසාධනයට අදාළව සවිස්තරාත්මකව සිදුකළ විමර්ශනයේ වාර්තාව මේ සමග ඉදිරිපත් කරමි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148 ව්‍යවස්ථාව ප්‍රකාරව පාර්ලිමේන්තුව සතු මූල්‍ය පාලනයට ඍජුව සම්බන්ධ වන පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ විමර්ශන කටයුතු මඟින්, රටේ පොදු ව්‍යාපාරයන්හි මූල්‍ය හා අනෙකුත් වත්කම් කළමනාකරණය වැදගත් කාර්යයක් බව හඳුනා ගෙන ඇත. 1972 අංක 01 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා පනත මඟින් පිහිටුවා ඇති ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව (LRC) මඟින් ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණු වූ අසමාන ඉඩම් බෙදාහැරීම් යථා තත්ත්වයට පත් කිරීම, ගොවි ජනතාවට ආරක්ෂිත භූමි හිමිකම් ලබා දීම, සහ රාජ්‍ය ඉඩම් ඵලදායී ලෙස භාවිතයට යොදවා ජාතික ආර්ථිකය ශක්තිමත් කිරීම මෙම ආයතනය විසින් කොතරම් දුරට ඉටු කර තිබේද යන්න සම්බන්ධයෙන් කාරක සභාව පරීක්ෂා කළ අතර, එහිදී හඳුනාගත් පනතේ අරමුණුවලින් බැහැරව කොමිෂන් සභාව ක්‍රියාකිරීම සම්බන්ධයෙන් පැන නගින ගැටලු නිරාකරණය කර, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ පරිපාලන කටයුතු විධිමත් කිරීමටත්, පනතට අදාළව ඉඩම් හා සම්බන්ධ සංවර්ධන කටයුතු නිසි ලෙස ඉටු කිරීමටත් කාරක සභාව විසින් නිර්දේශ ගණනාවක් ඉදිරිපත් කර ඇත.

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ විමර්ශනයන් මඟින් ලැබිය යුතු උපරිම සේවය රටට ලැබෙන්නේ මෙම කමිටුවේ නිර්දේශ කෙරෙහි වගකිව යුතු සියලු පාර්ශ්වයන්ගේ අවධානය යොමු කරවීම හරහාය. එහිදී රටේ පරමාධිපත්‍ය හිමි මහජනතාවගේ සහ ඔවුන්ගේ නියෝජිතයන් ලෙසින් මේ ගරු සභාවේ අවධානය මෙහි ඉදිරිපත් වන නිර්දේශ කෙරෙහි යොමු කරවීම හරහා මෙම උත්සාහය වඩාත් ඵලදායී වන බව කියනු කැමැත්තෙමි.

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ කාර්යභාරය සාර්ථකව ඉටුකර ගැනීම සඳහා එම කමිටුවේ සාමාජික ගරු මන්ත්‍රීවරුන්ගෙන් ලැබෙන සහායත්, කථානායකතුමා ප්‍රධාන පාර්ලිමේන්තුවේ කාර්ය මණ්ඩලය හා පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ උපදේශකවරුන් දෙදෙනාගේ සහායත්, භාණ්ඩාගාර නිලධාරීන්ගේ සහ වැඩබලන විගණකාධිපතිතුමා ප්‍රධාන ජාතික විගණන කාර්යාලයෙන් ලැබෙන සහයෝගයත් අගය කොට සලකමි.

**වෛද්‍ය නිශාන්ත සමරවීර**
සභාපති
පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව

## විධායක සාරාංශය

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව පිළිබඳව පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව (CoPE) විසින් 2025 මැයි 8 සහ ජූලි 17 යන දිනවල පැවැත්වූ විමර්ශනය මඟින් 2022 සහ 2023 වසරවල විගණකාධිපති වාර්තා සහ කොමිෂන් සභාවේ වත්මන් කාර්ය සාධනය කෙරෙහි අවධානය යොමු කරන ලදී.

එහිදී ආයතනයේ ක්‍රියාකාරිත්වය, මූල්‍ය කළමනාකරණය සහ මානව සම්පත් කළමනාකරණය තුළ බරපතල අක්‍රමිකතා රැසක් අනාවරණය විය. මෙම ගැටලු ආයතනයේ අරමුණු සාක්ෂාත් කර ගැනීමට බාධාවක් වී ඇති අතර, නීතිමය හා මූල්‍යමය වශයෙන් සැලකිය යුතු අවදානම් තත්ත්වයන් ඇති කර තිබුණි.

කොමිෂන් සභාවේ මානව සම්පත් කළමනාකරණය දැඩි අවිධිමත් තත්ත්වයක පවතින බව කාරක සභාවේ ප්‍රධාන නිරීක්ෂණයක් විය. 2018 අමාත්‍ය මණ්ඩල තීරණයක් මත බඳවාගත් සේවකයන්, අනුමත සංඛ්‍යාවට වඩා වැඩි ප්‍රමාණයක් සිටින බවත්, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව ඔවුන්ට ස්ථිර පත්වීම් ලබා දී ඇති බවත්, කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ පත්වීම අමාත්‍යාංශ ලේකම්වරයාගේ ලිඛිත උපදෙස් නොසලකා, අවලංගු වූ සම්මුඛ පරීක්ෂණයක ලකුණු පදනම් කොට ගෙන ලබා දීම හේතුවෙන් එකී පත්වීම වලංගු පත්වීමක් නොවන බවත් අනාවරණය විය.

කොමිෂන් සභාවේ මූල්‍ය කළමනාකරණයද දැඩි ගැටලුකාරී තත්ත්වයක පැවතුණ බව නිරීක්ෂණය විය. එයට නිදසුනක් ලෙස **කාබනික පොහොර ව්‍යාපෘතිය පෙන්වා දිය හැකිය**. මෙම ව්‍යාපෘතිය සඳහා රුපියල් මිලියන 302කට අධික මුදලක් වියදම් කර තිබුණද, ඉන් ලබා තිබුණු ආදායම වූයේ රුපියල් මිලියන 22 ක් පමණි. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා පනතට අනුව මෙවැනි ව්‍යාපෘති සඳහා මුදල් යෙදවීමට නෛතික බලයක් නොතිබුණද, නිලධාරීන්ගේ උපදෙස් නොතකා මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබුණි තවද, කිසිදු ශක්‍යතා අධ්‍යයනයකින් තොරව ආරම්භ කර ඇති මෙම ව්‍යාපෘතියේ ගොඩනැගිලි ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් නොවන ඉඩම්වල ඉදි කර තිබීමද බරපතල ගැටලුවකි. මෙය රාජ්‍ය මූල්‍ය රෙගුලාසිවලට පටහැනි ක්‍රියාවක් වන අතර, මෙම අක්‍රමිකතාවට වගකිව යුතු පාර්ශ්වයන් පිළිබඳව පූර්ණ විමර්ශනයක් පවත්වා, වාර්තාවක් ඉදිරිපත් කිරීමට කාරක සභාව නිර්දේශ කරන ලදී.

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු ඉඩම් කළමනාකරණයේදී ද බරපතල ගැටලු පවතින බව අනාවරණය විය. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු ඉඩම්, ගැසට් පත්‍ර මඟින් වෙනත් රාජ්‍ය ආයතන වෙත පැවරීම හේතුවෙන්, දැනටමත් කොමිෂන් සභාවට එරෙහිව නඩු 600කට ආසන්න සංඛ්‍යාවක් පවතින අතර, ඒ සඳහා විශාල රාජ්‍ය අරමුදල් ප්‍රමාණයක් වැය වෙමින් පවතී. එමෙන්ම, විකල්ප ඉඩම් ලබා දීමේ ක්‍රියාවලියේදී ද විශාල වංචා හා දූෂණ සිදුවී ඇති බවට වාර්තා වී ඇත. මියගිය පුද්ගලයන්ගේ නම් යොදා ගනිමින් ඉඩම් ගනුදෙනු සිදු කිරීම එවැනි අපරාධමය ක්‍රියාවකි. මෙම නීතිමය අර්බුදයන්ට විසඳුම් ලබා දීම සඳහා නීතිපති උපදෙස් ලබාගෙන, පවතින නඩු කඩිනමින් විසඳා ගැනීමටත්, අනාගතයේ එවැනි ගැටලු

ඇතිවීම වැලැක්වීම සඳහා නව නීති සම්පාදනය කිරීමටත් කාරක සභාව නිර්දේශ කරන ලදී.

ඉහත කරුණුවලට අමතරව, කොමිෂන් සභාව සතු ඉඩම්වල වටිනාකම තක්සේරු කර ලේඛනගත කර නොමැති බවත්, ඉඩම්වල අනවසර පදිංචිකරුවන් සිටින බවත්, ඔවුන් ඉවත් කිරීමට නිසි පියවර ගෙන නොමැති බවත් කාරක සභා රැස්වීමේදී අනාවරණය විය.

සමස්තයක් ලෙස ගත් කල, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව නිසි පරිපාලනයකින් තොරව ක්‍රියා කර ඇති බවත්, එමඟින් රජයට සහ මහජනතාවට අගතිගාමී බලපෑම් ඇති වී ඇති බවත් මෙම වාර්තාවෙන් පැහැදිලි වේ. මෙම තත්ත්වය නිවැරදි කිරීම සඳහා, ආයතනය වහාම ප්‍රතිව්‍යුහගත කිරීම, එහි සංයුක්ත සැලැස්ම යාවත්කාලීන කිරීම සහ විනිවිදභාවයෙන් හා වගකීමෙන් යුතුව කටයුතු කිරීම අත්‍යවශ්‍ය බව කාරක සභාව අවධාරණය කරයි.

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් පස්වැනි වාර්තාව ලෙස ඉදිරිපත් කරන ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව පිළිබඳ වාර්තාවේ ඇතුළත් කරුණු පරිශීලනය කිරීමේ පහසුව සඳහා සංක්ෂිප්තව පහත පරිදි දැක්විය හැකිය.


| අනු අංකය | මාතෘකාව | පිටු අංකය |
|---|---|---|
| **2025.05.08 දින සාකච්ඡාවට ලක් කළ කරුණු** | | **02 - 07** |
| **01** | සංයුක්ත සැලැස්ම | 02 |
| **02** | අනුමත කාර්ය මණ්ඩලය හා කාර්ය මණ්ඩලය බඳවා ගැනීම හා සම්බන්ධ ගැටලු | 02 - 05 |
| **03** | කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් තනතුරට නිලධාරියෙකු තෝරා පත් කර ගැනීමේ ක්‍රමවේදය | 05 - 06 |
| **04** | ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා අරමුදලෙන් කාබනික පොහොර ව්‍යාපෘතිය සඳහා මුදල් වියදම් කිරීම | 06 - 07 |
| **2025.07.17 දින සාකච්ඡාවට ලක් කළ කරුණු** | | **08 - 20** |
| **05** | එන්. විමලරාජ් මහතා විසින් කොමිෂන් සභාවේ ඉඩම් නීති විරෝධී ලෙස බැහැර කිරීම සම්බන්ධයෙන් පැවැත් විය යුතු විනය පරීක්ෂණය (2023.04.26 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ නිර්දේශ අංක 05) | 08 - 09 |
| **06** | ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු නොවූ රත්නපුර රාස්සගල වත්ත ඉඩම් හිමිකමක් වෙනුවට සී.කිරිඇල්ල මහත්මියට හන්තාන ප්‍රදේශයේ විකල්ප ඉඩම් ලබාදීම | 09 - 10 |

| | | |
|---|---|---|
| 07 | කොමිෂන් සභාව පවරාගත් ඉඩමක් වෙනුවට හන්තාන - ඌරාගල වත්තෙන් අක්කර 25 ක් ලබා දීම | 10 - 11 |
| 08 | ඉඩම් ලේඛනයට අනුව බදු දී ඇති ඉඩම් ප්‍රමාණය සහ එම ඉඩම්වල සමස්ත වටිනාකම | 11 |
| 09 | ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ සේවකයන්ට ඉඩම් ලබාදීම | 12 |
| 10 | ඉඩම් ලේඛනය සකස් කිරීම | 12 |
| 11 | එස්.ආර්.රෙන්ගනාදන් මහතාට ඉඩම් ලබාදීම (මාතලේ බේගෲප් වත්ත) | 13 |
| 12 | මාලනී නානායක්කාර මහත්මියට ඉඩම් ලබාදීම (ඉඹුල්ගස්වාඩිය, කටාන) | 14 |
| 13 | "උරුමය" වැඩසටහන යටතේ ඔප්පු ප්‍රදානය සහ ඒ සඳහා වියදම් | 14 |
| 14 | වාල්ස් නෙවිල් උදලාගම මහතාට ඉඩම් ලබාදීම (මාතලේ කෝන්ගස්යාය) | 15 - 16 |
| 15 | ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් ඉඩම් ගැසට් පත්‍ර මඟින් වෙනත් ආයතන වෙත පැවරීම සහ ඉන් පසු එම ඉඩම්වල අයිතිය සම්බන්ධයෙන් පැන නැඟී ඇති ගැටලු | 16 - 18 |
| 16 | විකල්ප ඉඩම් ලබා දීමේ බලතල සහ ක්‍රියාපටිපාටිය | 18 - 19 |
| 17 | නියාගම වෘත්තීය පුහුණු අධිකාරියට පවරා දීමට නියමිතව පැවැති ඉඩමක් ලක්ෂ්මන් නානායක්කාර මහතාට ලබා දීමට නඩුවක දී එකඟතාවය පළ කිරීම | 19 |
| 18 | ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට විගණකාධිපතිවරයා විසින් 2022 සහ 2023 වර්ෂවලට අදාළව ඉදිරිපත් කර ඇති විගණන නිරීක්ෂණ | 20 |

**දසවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභාවාරය**
**පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ පස්වැනි වාර්තාව**

සියලු රාජ්‍ය සංස්ථා ද යම් ලිඛිත නීතියක් යටතේ රජය වෙත පවරනු ලැබ ඇති වෙළඳ ව්‍යාපාර සහ වෙනත් ව්‍යාපාර සහ 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි වී ඇති හෝ ලියාපදිංචි වී ඇති බවට සලකනු ලබන සහ ස්වකීය කොටස්වලින් සියයට පනහක් හෝ ඊට වැඩි ප්‍රතිශතයක් රජය හෝ රාජ්‍ය සංස්ථාවක් හෝ පළාත් පාලන ආයතනයක් හෝ විසින් දරනු ලබන සමාගම් සම්බන්ධව පාර්ලිමේන්තුව ඉදිරියේ තබනු ලබන ගිණුම් සහ වර්තමාන කාර්යසාධනය, විගණකාධිපතිවරයාගේ සහාය ඇතිව පරීක්ෂා කිරීම පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ කාර්යය වේ.

වර්තමානයේ දී, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ අධීක්ෂණය යටතට ගැනෙන, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව හා ජාතික අය වැය දෙපාර්තමේන්තුව යටතේ නියාමනය වනු ලබන පොදු ව්‍යාපාර 462 ක් පවතී. (මූලාශ්‍රය: රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව)

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව දසවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභාවාරයේ (පළමු මාස 10 තුළදී) දී පහත සඳහන් පරිදි කාරක සභා රැස්වීම් පවත්වා ඇත.

| අනු අංකය | කැඳවූ ආයතනය | කාරක සභාව පැවැත් වූ දිනය |
|---|---|---|
| 1. | ජාතික තරුණ සේවා සභාව | 18.02.2025 |
| 2. | ජාතික තරුණ සේවා සභාව | 20.02.2025 |
| 3. | ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය | 27.02.2025 |
| 4. | ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය | 05.03.2025 |
| 5. | ජාතික ඖෂධ නියාමන අධිකාරිය | 12.03.2025 |
| 6. | ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය | 27.03.2025 |
| 7. | ගුවන්තොටුපළ සහ ගුවන් සේවා (පුද්) සමාගම | 02.04.2025 |
| 8. | ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව | 08.05.2025 |
| 9. | ගුවන්තොටුපළ සහ ගුවන් සේවා (පුද්) සමාගම | 09.05.2025 |
| 10. | ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල | 15.05.2025 |
| 11. | ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය | 23.05.2025 |
| 12. | ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය | 04.06.2025 |
| 13. | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය | 20.06.2025 |
| 14. | මහපොළ භාරකාර අරමුදල | 09.07.2025 |
| 15. | ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව | 17.07.2025 |

| | | |
|---|---|---|
| 16. | රාජ්‍ය දැව සංස්ථාව | 23.07.2025 |
| 17. | සිවිල් ගුවන් සේවා අධිකාරිය | 20.08.2025 |
| 18. | ශ්‍රී ලංකා වරාය අධිකාරිය | 10.09.2025 |
| 19. | භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය | 12.09.2025 |
| 20. | ලංකා විදුලිබල මණ්ඩලය | 24.09.2025 |
| 21. | ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය | 08.10.2025 |
| 22. | ලංකා සතොස ලිමිටඩ් | 10.10.2025 |
| 23. | එල්.ටී.එල්. හෝල්ඩිංස් සමාගම හා එහි පරිපාලිත සමාගම් | 24.10.2025 |

ඒ අතරින්, **2025.05.08 හා 2025.07.17** යන දෙදින තුළ පරීක්ෂාවට ලක් කළ, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය යටතේ ඇති ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ 2022 සහ 2023 වර්ෂවලට අදාළ විගණකාධිපති වාර්තා සහ එම කොමිෂන් සභාවේ වර්තමාන කාර්යසාධනය පරීක්ෂාවට ලක් කොට නිකුත් කළ කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ මෙම වාර්තාවට අන්තර්ගත කර ඇත.

## මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණන මතය

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් 2022, 2023 හා 2024 වර්ෂයන්ට අදාළව ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණකාධිපතිවරයාගේ මතය පහතින් දක්වා ඇත.

| ආයතනය | විගණන මතය | | |
|---|---|---|---|
| | **2022** | **2023** | **2024** |
| ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව | මතය ව්‍යාවනය කිරීම | මතය ව්‍යාවනය කිරීම | මතය ව්‍යාවනය කිරීම |

**විගණන මත වර්ග**

**01 තත්ත්වාගණනය නොකළ මතය (Unqualified Opinion)**
මූල්‍ය ප්‍රකාශන ආයතනයේ මූල්‍ය තත්ත්වය සාධාරණව ඉදිරිපත් කර ඇති බව

**02 තත්ත්වාගණනය කළ මතය (Qualified Opinion)**
වාර්තාවේ සඳහන් කරුණුවලින් වන බලපෑම හැර ආයතනයේ මූල්‍ය තත්ත්වය, මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව.

**03 මතය ව්‍යාවනය කිරීම (Disclaimer of Opinion)**
ප්‍රමාණවත් හෝ උචිත විගණන සාක්ෂි හඳුනාගැනීමට නොහැකිවීම නිසා ගිණුම් සම්බන්ධව මතයක් ප්‍රකාශ කළ නොහැකි බව.

**04 අහිතකර මතය (Adverse Opinion)**
ආයතනයේ මූල්‍ය තත්ත්වය, මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව.

**ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව**
***(කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය)***
**විමර්ශනය කරන ලද දින - 2025.05.08 හා 2025.07.17**

**2025.05.08 දින සාකච්ඡාවට ලක් කළ කරුණු**

**01. සංයුක්ත සැලැස්ම**

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට 2026 -2030 වසර සඳහා ස්ව නිර්මාණාත්මක නව සංයුක්ත සැලැස්මක් සකස් කළ යුතු බව කාරක සභාව නිරීක්ෂණය කළාය.

කාරක සභාවේ නිර්දේශ

I. **වර්තමානයේ සිදු වී ඇති දේශපාලනික හා ආර්ථික ප්‍රතිපත්තිමය වෙනස්කම්වලට අනුරූප වන පරිදි, ආයතනයේ නිලධාරින් විසින් ආයතනයට වඩාත් සුදුසු, යාවත්කාලින, සංයුක්ත සැලැස්මක් සකස් කිරීම.**

**02. අනුමත කාර්ය මණ්ඩලය හා කාර්ය මණ්ඩලය බඳවා ගැනීම හා සම්බන්ධ ගැටලු**

කොමිෂන් සභාවේ 2025 ජනවාරි 31 දිනට අනුමත හා තත්‍ය කාර්ය මණ්ඩල සංයුතිය පිළිබඳ විස්තර පහත පරිදිය.

| සේවක කාණ්ඩය | අනුමත සංඛ්‍යාව | තත්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ කළමනාකරණ | 5 | 5 | - |
| මධ්‍යම කළමනාකරණ | 33 | 31 | 2 |
| තාක්ෂණික | 6 | 3 | 3 |
| කනිෂ්ඨ කළමනාකරණ<br>• පුද්ගලික කර ඇති තනතුරු | 4<br>28 | 3<br>20 | 1 |
| කළමනාකරණ සහකාර<br>• පුද්ගලික කර ඇති තනතුරු | 215<br>40 | 135<br>40 | 80 |
| ප්‍රාථමික | 61 | 37 | 24 |
| **එකතුව** | **392** | **274** | **110** |

කොමිෂන් සභාවේ තත්‍ය කාර්ය මණ්ඩලය සම්බන්ධයෙන් පහත ගැටලු පවතින බව කාරක සභාව නිරීක්ෂණය කළාය.

| ගැටළුව | කාරක සභාවේ නිරීක්ෂණය |
|---|---|
| **2018 ජුනි 27 දිනැති අමප/18/1126/829/002 අංක දරන අමාත්‍ය මණ්ඩල අනුමැතිය.** | 2018 දී නිලධාරින් 214 ක් වර්ෂයක කාලයක් සඳහා බඳවා ගැනීමට සහ කාර්ය සාධනය මත වසර 3ක් දක්වා ඔවුන්ගේ සේවය දීර්ඝ කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත. |
| **අනුමත සේවක සංඛ්‍යාව ඉක්මවා බඳවා ගැනීම් සහ ස්ථිර පත්වීම ලබා දීම.** | අනුමත සංඛ්‍යාවට වඩා කළමනාකරණ සහකාර 12ක් සහ කාර්යාල සහායක 8ක් වැඩිපුර බඳවා ගැනීම. වසර 3 අවසන් වීමෙන් පසු **කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව** කළමනාකරණ සහකාර 138ක් ඇතුළු පිරිසකට ස්ථිර පත්වීම් ලබා දීම. |
| **අනුමැතියකින් තොරව කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම.** | **කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව** කළමනාකරණ සහකාර 34ක් සහ ප්‍රාථමික තනතුරු 4ක් (කොන්ත්‍රාත් පදනමින්) ගෙන තිබීම. |

'ඔප්පු දස ලක්ෂයක් ප්‍රදානය කිරීමේ වැඩසටහන' කඩිනම් කිරීමට බඳවාගත් මෙම සේවකයින්ට (වසරකට බලපත්‍ර 20,000ක් නිකුත් කිරීමේ ඉලක්කයක් සහිතව) ක්ෂේත්‍ර නිරීක්ෂණ හා කෙටුම්පත් කිරීමේ රාජකාරි පැවරී තිබූ නමුත් එම ඉලක්ක සපුරා නොමැති බව නිරීක්ෂණය විය. 2018 අමාත්‍ය මණ්ඩල සංදේශයක් මඟින් සේවක හිඟය පෙන්වා බඳවා ගැනීමට යෝජනා ඉදිරිපත් කර ඇතත්, පසුව අනුමැතිය ලබා ගැනීමේ පදනම මත රාජ්‍ය සේවයේ පත්වීම් දීම අනීතික ක්‍රියාවක් බව කාරක සභාවට නිරීක්ෂණය විය. දේශපාලනික අරමුණු මත කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව බඳවා ගැනීම් සිදු කිරීම නිසා මෙම සේවකයින්ට අනුමත තනතුරු සංඛ්‍යාව තුළ ස්ථිර පත්වීම් ලබා දිය නොහැකි වීමෙන් ආයතන සහ සේවකයින්ද ගැටලුවලට මුහුණ පා ඇත. එසේම, කාර්ය සාධනය පරීක්ෂා කිරීමේ ක්‍රමවේදයක් නොමැතිව ස්ථිර කිරීම් සිදු කිරීම, නිසි ක්‍රමවේද හා නීතිමය නිර්දේශ නොපිළිපැදීම ආයතනික ගැටලු රැසකට හේතුවී ඇත.

නිසි සුදුසුකම් සහිත අයගෙන් පමණක් අනුමත කාර්ය මණ්ඩලය තුළ පවතින පුරප්පාඩු පිරවීමට සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් පත් කොට එම තනතුරුවලට බඳවා ගැනීම් සිදු කිරීමට කටයුතු සිදු කරන බව කොමිෂන් සභාවේ සභාපති ප්‍රකාශ කළේය.

<u>කාරක සභාවේ නිර්දේශ</u>

**I.** මෙම අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව සිදු කර ඇති බඳවා ගැනීම් සම්බන්ධයෙන් වූ සමස්ථ ක්‍රියාවලිය පිළිබඳ පහත කරුණු ද ඇතුළත් වන පරිදි නිශ්චිත විමර්ශනයක් සිදු කිරීම සහ නැවත ඒ සම්බන්ධයෙන් ගැටළු ඇති නොවන ආකාරයට බඳවා ගැනීමේ ගැටළු විසඳා ගැනීමට කටයුතු කිරීම.

- උක්ත බඳවා ගැනීම් සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ හා අනෙකුත් ආයතනවලින් අදාළ අනුමැතිය ලබා නොගැනීම සහා ආවරණ අනුමැතියට යටත්ව බඳවා ගැනීම් සිදු කිරීම සම්බන්ධව, හා බඳවා ගැනීමේදී ආයතනයේ නිලධාරීන් විසින් සිදු කර ඇති වැරදි සම්බන්ධයෙන්,

- බඳවා ගැනීමට අදාළව දැන්වීම් පළ කළ ආකාරය ලැබූ අයදුම්පත් ගණන, පවත්වන ලද සම්මුඛ පරීක්ෂණ පිළිබඳ තොරතුරු, පත්වීම් ප්‍රදානය කිරීමට තෝරාගත් ආකාරය, පත්වීම්ලාභීන්ගේ තොරතුරු,

- බඳවා ගැනීමේ අරමුණු ළගා කරගෙන නොමැති නම් එයට හේතු,

- අනුමැතිය ඉක්මවා බඳවා ගැනීම් සිදු කිරීමට හේතු,

- අදාළ බඳවා ගැනීම් සිදු කිරීමට අනුමැතිය ලබාදුන් කොමිෂන් සභා සාමාජිකයන් සහ වගකිව යුතු සියලුම නිලධාරි මණ්ඩලය පිළිබඳ තොරතුරු සහ ඒ ඒ අදාළ අදියරවලදී අනුමැතිය ලබා දුන් නිලධාරීන් සම්බන්ධ තොරතුරු,

- උක්ත බඳවා ගැනීම්වලට අදාළ කාර්යභාරය ඉටු කිරීමට පටහැනිව මෙම සේවකයින්ගෙන් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ ස්ථිර තනතුරු දරන නිලධාරීන්ගේ කාර්යයන් ඉටුකර ගෙන තිබේද? එසේ නම් ඒ සඳහා නියෝග ලබා දුන් නිලධාරීන් සම්බන්ධව,

- මෙම සේවක බඳවා ගැනීම් සම්බන්ධයෙන් අපේක්ෂිත අරමුණු, කාර්ය භාරය ඉටු නොවීමට හේතු සහ අමාත්‍ය මණ්ඩල සංදේශයේ සඳහන් උපලේඛන 03 අනුව කටයුතු කර තිබේද යන්න සලකා බැලීම,

- මෙම සේවකයන් මේ වනවිට ඉටුකරන කාර්ය භාරය සහ ඔවුන්ව ඵලදායිව යොදා ගැනීමට සැලසුමක් ඉදිරිපත් කිරීම,

- අවශ්‍ය කාර්ය සාධනය ඉටු කිරීමකින් තොරව මෙම සේවකයින් ස්ථිර කිරීම සිදු කළේ කෙසේද යන්න පිළිබඳව,

- **මෙලෙස අනුමැතියකින් තොරව බඳවා ගෙන මේ වන විට ස්ථිර කළ සේවක සංඛ්‍යාව, ස්ථිර නොකළ සංඛ්‍යාව, තවදුරටත් කොන්ත්‍රාත් පදනම මත සේවයේ නිරත වන සේවක සංඛ්‍යාව, අනුමත කාර්ය මණ්ඩලය තුළ පවතින පුරප්පාඩු සඳහා සුදුසුකම් සපුරා තිබේ නම් ස්ථිර කළ හැකි සංඛ්‍යාව සහ අනුමත කාර්ය මණ්ඩලය තුළට අන්තර්ග්‍රහණය කර ගත හැකි හා නොහැකි තනතුරු සංඛ්‍යාව,**

- **අනුමත කාර්ය මණ්ඩලයට බඳවා ගැනීමේදී, බඳවා ගැනීමේ පරිපාටියට (SoR) අනුව කටයුතු කර තිබෙන බවට තහවුරු කරගෙන නැවතත් ගැටළුකාරී තත්වයන් ඇති නොවන ආකාරයට කටයුතු කිරීම.**

**03. <u>කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් තනතුරට නිලධාරියෙකු තෝරා පත් කර ගැනීමේ ක්‍රමවේදය</u>**

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් තනතුරට නිළධාරියකු පත් කර ගැනීමේ දී නීත්‍යානුකූල ක්‍රියා පටිපාටිය උල්ලංඝනය වී ඇති බව කාරක සභාවේ දී නිරීක්ෂණය විය. 2023 ජූලි 11 වන දින ප්‍රථම වරට අයදුම්පත් කැඳවා සම්මුඛ පරීක්ෂණයක් පවත්වා ඇති අතර, එහිදී වැඩිම ලකුණු ලබාගත් වැඩබලන අධ්‍යක්ෂ ජනරාල්වරයාට පසුව **2024.05.09 දින එම තනතුරේ පත්වීම ලබා දී තිබුණි.** එහෙත්, 2023 සම්මුඛ පරීක්ෂණයේ ප්‍රතිඵල නිකුත් නොකිරීම සහ මාස 6ක් ඉක්මවා යාම හේතුවෙන් අමාත්‍යාංශ ලේකම්වරයා විසින් නව සම්මුඛ පරීක්ෂණයක් පවත්වා අධ්‍යක්ෂ ජනරාල්වරයෙකු තෝරා ගැනීමට උපදෙස් ලබා දී තිබුණි. ඒ අනුව, **2024 අප්‍රේල් 08 දින නව දැන්වීමක් පළ කළ වහාම පූර්ව සම්මුඛ පරීක්ෂණ ප්‍රතිඵල අවලංගු වන නීතිමය ක්‍රමවේදය** තිබියදී, කොමිෂන් සභාව විසින් 2023 පැරණි සම්මුඛ පරීක්ෂණ ප්‍රතිඵල මත පදනම්ව පත්වීම ලබා දී තිබුණි. 2024 අප්‍රේල් 08 කැඳවූ සම්මුඛ පරීක්ෂණය පවත්වා නැති අතර, ඒ පිළිබඳ අයදුම්කරුවන්ට දැනුම් දී නොතිබුණි. ස්වයං මූල්‍යායන ආයතනවලට පවා ප්‍රධාන ගණන් දීමේ නිලධාරි ලෙස අමාත්‍යාංශ ලේකම්වරයාගේ තීරණයට පටහැනිව ක්‍රියා කළ නොහැකි බව අවධාරණය කළ, කාරක සභාව මෙම පත්වීම **වලංගු නොවන පත්වීමක්** ලෙසත්, එම නිලධාරියාට තනතුරේ රාජකාරි **කිරීමට බලයක් නොමැති** බවත් පෙන්වා දෙන ලදි. නිසි ක්‍රියාපටිපාටි, චක්‍රලේඛ විධිවිධාන සහ ප්‍රධාන ගණන් දීමේ නිලධාරියාගේ නියෝග නොසලකා හැරීම සම්බන්ධයෙන් කාරක සභාව **දැඩි අප්‍රසාදය** පළ කළාය.

<u>කාරක සභාවේ නිර්දේශ</u>

**I. 2023.07.31 දින පවත්වන ලද සම්මුඛ පරීක්ෂණයට මාස 06 කට වඩා කාලයක් ඉකුත්ව ඇති බැවින් නැවත සම්මුඛ පරීක්ෂණයක් පවත්වා අදාළ බඳවා ගැනීම් සිදුකරන ලෙස ලිඛිතව නියෝග ලබාදී තිබිය දී, කොමිෂන් සභාවේ අනුමැතිය මත 2024.04.08 දින කැඳවන ලද අයදුම්පත් මත සම්මුඛ පරීක්ෂණයක් නොපවත්වා පූර්ව සම්මුඛ පරීක්ෂණ ප්‍රතිඵල මත අධ්‍යක්ෂ ජනරාල් තනතුරට බඳවා ගැනීම සහ**

**අනිත් අයදුම්කරුවන්ට කිසිදු දැනුම්දීමක් සිදු නොකිරීම සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් පැවැත්වීම.**

II. **කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් තනතුරට බඳවා ගැනීම නිවැරදි ක්‍රමවේදය අනුව කඩිනමින් සිදු කිරීම.**

**04. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා අරමුදලෙන් කාබනික පොහොර ව්‍යාපෘතිය සඳහා මුදල් වියදම් කිරීම**

හිටපු ඉඩම් අමාත්‍යවරයා විසින් 2021.05.25 දින ඉදිරිපත් කළ අමාත්‍ය මණ්ඩල සංදේශයක් මඟින්, 'ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ අනුග්‍රහය ඇතිව උතුරු මැද පළාතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් **කාබනික පොහොර නිෂ්පාදන නියමු ව්‍යාපෘතියක්** ආරම්භ කිරීමට යෝජනා කර තිබුණි. මෙම ව්‍යාපෘතිය ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා පනතේ 22 (1) (ඇ) හා 54 වගන්තියෙහි ප්‍රතිපාදන යටතේ කොමිෂන් සභාව සතු ඉඩම් සහ අරමුදල් භාවිතා කර එක් ප්‍රාදේශීය ලේකම් කොට්ටාසයකින් මසකට මෙට්‍රික් ටොන් 300ක පොහොර නිෂ්පාදනයෙන් රුපියල් මිලියන 09ක මාසික ආදායමක් ඉපයීමට අපේක්ෂා කර තිබුණි. මේ සම්බන්ධයෙන් කාරක සභාවට පහත කරුණු නිරීක්ෂණය කළාය.

| කරුණ | විස්තරය |
|---|---|
| **ව්‍යාපෘති තත්ත්වය** | රු. මිලියන 350ක ව්‍යාපෘතිය සඳහා රු. මිලියන 302ක් වියදම් කර තිබුණද, ආදායම් ලැබී තිබුණේ **රු. මිලියන 22ක්** පමණි. ව්‍යාපෘතිය අසාර්ථක වීම නිසා එය රජයේ පොහොර සමාගමට පවරා දීමට නියෝග කර තිබුණද, එම වත්කම් පවරා දීම මේ දක්වා සිදු වී නොතිබුණි. |
| **නීත්‍යානුකූලභාවය** | ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ නීති නිලධාරි විසින් ව්‍යාපෘතිය සඳහා කොමිෂන් සභා අරමුදල් යෙදවීමට **නෛතික අවකාශයක් නොමැති** බවට නිරීක්ෂණ ඉදිරිපත් කර තිබුණි. |
| **විමර්ශන** | 2023.03.28 දිනැති හා අංක/23/383/615/017 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මගින් ව්‍යාපෘතිය අසාර්ථක වීමට හේතු සහ මුදල් භාවිතය පිළිබඳ ස්වාධීන පූර්ණ විමර්ශනයක් සිදු කිරීමට යෝජනා කර තිබුණි. සංචාරක හා ඉඩම් අමාත්‍යාංශ ලේකම් විසින්ද කමිටුවක් පත් කර තිබුණද, එහි වාර්තාව ඉදිරිපත් කොට නොතිබුණි. |

| කරුණ | විස්තරය |
|---|---|
| **බඳවා ගැනීම්** | හිටපු ඉඩම් අමාත්‍යවරයාගේ ලිඛිත දැනුම්දීමකට අනුව ව්‍යාපෘති නිලධාරීන් 27ක් සහ කළමනාකරුවන් 8ක් බඳවාගෙන තිබුණි. |
| **වත්කම් බැහැර කිරීම** | උතුරු මැද පළාතේ ස්ථාන 5ක මෙම ව්‍යාපෘතිය යටතේ ඉදිකළ ගොඩනැගිලි 5ක් නිශ්කාර්යව පැවතින අතර, ඒවා පිහිටා ඉදිකර ඇත්තේ **ප්‍රාදේශීය ලේකම් සතු ඉඩම්වලය**. යන්ත්‍රෝපකරණ ත්‍රිවිධ හමුදාව ඇතුළු ආයතන කිහිපයකට භාර දී තිබුණි. |
| **නිෂ්පාදන තත්ත්වය** | නිෂ්පාදනය කළ කාබනික පොහොර (3100 MT) හි නයිට්‍රජන් ප්‍රමාණය ප්‍රමිතියට වඩා අඩු වීම නිසා නොමිලයේ බැහැර කිරීමට නිර්දේශ කර තිබුණි. |
| **ශක්‍යතා අධ්‍යයනය** | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට ප්‍රථම කිසිදු ශක්‍යතා අධ්‍යයනයක් සිදු කර නොතිබුණි. |

<u>කාරක සභාවේ නිර්දේශ</u>

**I.** **මෙම සමස්ත ව්‍යාපෘතිය පිළිබඳව අමාත්‍යාංශය විසින් මේ වන විට පවත්වා ගෙන යමින් සිටින පරීක්ෂණය කඩිනමින් අවසන් කිරීම.**

**II.** **අදාළ කාබනික පොහොර ව්‍යපෘතිය යටතේ ව්‍යාපෘති කටයුතු සිදුකළ මධ්‍යස්ථාන 35 ට අදාළ මධ්‍යස්ථානවල ලිපිනයන්, ව්‍යාපෘතියට සම්බන්ධ වූ ආයෝජකයින් පිළිබඳ තොරතුරු, බඳවා ගත් සේවකයින් පිළිබඳ තොරතුරු සහ ඔවුන් බඳවා ගත් ක්‍රමවේදය, මෙම මධ්‍යස්ථාන සඳහා දරන ලද පිරිවැය, ඉදිකළ ගොඩනැගිලි, එම ගොඩනැගිලි ඉදි කළ ඉඩම්වල සන්තකය සම්බන්ධ තොරතුරු සහ ලබා දුන් උපකරණ පිළිබඳ තොරතුරු හා ඒවායේ වර්තමාන තත්ත්වය සම්බන්ධයෙන් සම්පූර්ණ තොරතුරු ඇතුළත් වාර්තාවක් ඉදිරිපත් කිරීම.**

**III.** **එම පරීක්ෂණ වාර්තාව අදාළ නීතිමය කටයුතු සඳහා යොමු කිරීම.**

**<u>2025.07.17 දින සාකච්ඡාවට ලක් කළ කරුණු</u>**

**05. <u>කොමිෂන් සභාව සතු ඉඩම් දිස්ත්‍රික් අධ්‍යක්ෂ එන්. විමලරාජ් මහතා විසින් ඉඩම් නීති විරෝධී ලෙස බැහැර කිරීම සම්බන්ධයෙන් ඔහුට විරුද්ධව පැවැත් විය යුතු විනය පරීක්ෂණය</u>**

2023.04.26 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ දිස්ත්‍රික් අධ්‍යක්ෂවරයෙකු වූ එන්. විමලරාජ් මහතා විසින් **ඉඩම් 1,000කට වැඩි ප්‍රමාණයක් නීති විරෝධී ලෙස බැහැර කිරීම** සම්බන්ධයෙන් ඔහුට විරුද්ධව විධිමත් විනය පරීක්ෂණයක් පවත්වන ලෙස නිර්දේශ කර තිබුණද එම නිර්දේශය මෙතෙක් ක්‍රියාත්මක කර නොතිබුණි. එකම ඉඩම දෙවරක් මැනීමේ චෝදනාව පිළිබඳව මෙම නිලධාරියාට විරුද්ධව පවත්වන ලද විධිමත් විනය පරීක්ෂණ වාර්තාව අනුව 2023.02.27 වැනි දින ඔහුව සේවයෙන් පහ කර තිබුණි.ඊට එරෙහිව ඔහු විසින් අභියාචනාධිකරණයේ ගොනු කළ රිට් පෙත්සමට (CA(W) 147/2023) අදාළ නියෝගයට අනුව **2023.06.14 දින ඔහු නැවත සේවයේ පිහිටුවා තිබුණි.** අභියාචනාධිකරණය විසින් නිකුත් කර ඇති **වාරණ නියෝගය (stay order)** හේතුවෙන් මෙම නිලධාරියාට විරුද්ධව විනය පරීක්ෂණ පැවැත්වීම සිදු කළ නොහැකි බවට කොමිෂන් සභාවේ නිලධාරීන් කාරක සභාවට ප්‍රකාශ කළේය.

මෙම නිලධාරියා සම්බන්ධයෙන් පවත්වන ලද විධිමත් විනය පරීක්ෂණය විධිමත්ව, අභියෝගයට ලක් නොවන පරිදි සිදු කර නොමැති බවත්, ආයතනය වගකීම් විරහිතව කටයුතු කර ඇති බවත් කාරක සභාවේ දී නිරීක්ෂණය විය. අභියාචනාධිකරණය මඟින් ලබා දී ඇති වාරණ නියෝගය, අභියාචනාධිකරණය විසින් ඉහත කී නඩුවේදී ලබා දී ඇති වාරණ නියෝගය මෙම නිලධාරියා ඉඩම් 1,000 ක් නීති විරෝධී ලෙස බැහැර කිරීම සම්බන්ධයෙන් ඔහුට විරුද්ධව **විධිමත් විනය පරීක්ෂණයක් පැවැත්වීමට බාධාවක් වන්නේද යන්න පිළිබඳව නීතිමය අධ්‍යයනයක් සිදු කර අධිකරණයට කරුණු වාර්තා කිරීමට කොමිෂන් සභාව අපොහොසත් වී ඇති** බව කාරක සභාව නිරීක්ෂණය කළාය.

ඉඩම් 1,000ක් නීති විරෝධී ලෙස බැහැර කිරීම සම්බන්ධයෙන් ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරීවරයෙකු යටතේ පරීක්ෂණයක් පවත්වා වාර්තාවක් ලබා දී ඇති බවත්, එම වාර්තාව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට යොමු කිරීමෙන් අනතුරුව එම දෙපාර්තමේන්තුව විසින් පරීක්ෂණ කටයුතු ආරම්භ කර ඇති බවත්, මෙහිදී අනාවරණය විය. කෙසේවුවද, කොමිෂන් සභාවේ නිලධාරීන් විසින් ජාතික විගණන කාර්යාලයට නොමඟ යවන සුළු පිළිතුරක් වාර්තා කර ඇති බවද අනාවරණය විය.

සමස්තයක් ලෙස, මෙම සිදුවීමේදී කොමිෂන් සභාවේ නිලධාරීන් නිසි වගවීමෙන් යුතුව කටයුතු කර නොතිබීම සම්බන්ධයෙන් කාරක සභාව සිය **දැඩි අප්‍රසාදය** පළ කළාය.

<u>කාරක සභාවේ නිර්දේශ</u>

**I. කොමිෂන් සභාවේ දිස්ත්‍රික් අධ්‍යක්ෂක එන් විමලරාජ්.මහතා විසින් කොමිෂන් සභාව සතු ඉඩම් දාහකට වැඩි ප්‍රමාණයක් නීතිවිරෝධී ලෙස බැහැර කිරීම සම්බන්ධයෙන් 2023.04.26 දින පැවැති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා රැස්වීමේ දී ඔහුට විරුද්ධව විධිමත් විනය පරීක්ෂණයක් පැවැත්වීමට ලබා දුන් නිර්දේශය ක්‍රියාත්මක කිරීම.**

**II. ඉහත නිර්දේශය ක්‍රියාත්මක කිරීමට පෙර එන්. විමලරාජ් මහතා විසින් අභියාචනාධිකරණයේ පවරා තිබූ රිට් පෙත්සමට අදාළව එම අධිකරණය විසින් ලබා දී ඇති වාරණ නියෝගය (Stay Order) බාධාවක් වන්නේද යන්න සොයා බැලීම.**

**06. <u>ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු නොවූ රත්නපුර රාස්සගල වත්ත ඉඩම් හිමිකමක් වෙනුවට සී.කිරිඇල්ල මහත්මියට හන්තාන ප්‍රදේශයේ විකල්ප ඉඩම් ලබාදීම</u>**

රත්නපුර දිස්ත්‍රික්කයේ රාස්සගල වත්තේ අක්කර 22කට ආසන්න ඉඩම් හිමිකමක් තිබූ සී. කිරිඇල්ල මහත්මියට, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු නොවූ එම ඉඩම් කොටස වෙනුවට හන්තාන ප්‍රදේශයෙන් විකල්ප ඉඩම් ලබා දී තිබුණි. මෙම ඉඩම ඇය විසින් දැනටමත් විකුණා තිබූ බවට අනාවරණය විය. 2023.04.26 දින පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා රැස්වීමේදී, අමාත්‍යාංශ ලේකම්ගේ ප්‍රධානත්වයෙන් මීට සම්බන්ධ සියලු පාර්ශ්වයන්ගේ සහභාගීත්වයෙන් මෙම ගැටලුව නිරාකරණය කිරීමට ගත හැකි ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාවක් සති 2ක් තුළ ඉදිරිපත් කිරීමට නිර්දේශ කර තිබුණි.

අමාත්‍යාංශ ලේකම් විසින් ඉදිරිපත් කළ වාර්තාව අනුව, සී. කිරිඇල්ල මහත්මියට හන්තාන වත්තෙන් විකල්ප ඉඩම් ලබා දී තිබුණද, එම පැවරීම ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව මගින් සිදු කර නොතිබුණි. ඒ වෙනුවට, වැවිලි කර්මාන්ත අමාත්‍යාංශ ලේකම්ගේ 2006.10.27 දිනැති ලිපියක් මගින් ජනතා වතු සංවර්ධන මණ්ඩලයට අයත් හන්තාන වත්තෙන් අක්කර 43 රූඩ් 01 පර්චස් 26ක විශාල බිම් ප්‍රමාණයක් සී. කිරිඇල්ල මහත්මියට සහ පී. එස්. එම්. ජයවර්ධන මහත්මියට බැහැර කර ඇති බව කාරක සභාව නිරීක්ෂණය කළාය.

ඉහත කී අක්කර 22ක ඉඩම් කොටස කොමිෂන් සභාවට අයිති නොවූ නමුත්, කොමිෂන් සභාව මැදිහත් වී එය බලංගොඩ වැවිලි සමාගමට ලබා දී තිබීම ගැටලුකාරී විය.

සී. කිරිඇල්ල මහත්මිය අක්කර 50 ඉක්මවන ඉඩම් ප්‍රකාශකයෙකු නොවූ අයෙකු බැවින්, ඇයට ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවෙන් ඉඩම් ලබා දීමට කිසිදු නීතිමය බැඳීමක් නොමැති බවත්,රාස්සගල වත්තෙහි මෙම සම්පූර්ණ ඉඩම් කොටස කොමිෂන් සභාවට ලබා දී නොතිබූ බවත්, එය රාජ්‍ය වැවිලි සංස්ථාවට හිමිව පැවතුන බවත්, අවසානයේදී, සී. කිරිඇල්ල මහත්මියට හන්තාන වත්තෙන්

විකල්ප ඉඩම් ලබා දීම සිදු කර තිබුණේ ජනතා වතු සංවර්ධන මණ්ඩලය විසින් බවත් අනාවරණය විය.

මෙම සියලු කරුණු විමර්ශනය කිරීමෙන් අනතුරුව, සී. කිරිඇල්ල මහත්මියට රාස්සගල වත්තේ පවතින අක්කර 22ක හිමිකමට අදාළව, **ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ මැදිහත් වීමකින්** තොරව, වැවිලි කර්මාන්ත අමාත්‍යාංශ ලේකම්ගේ ලිපියක් මඟින් ජනතා වතු සංවර්ධන මණ්ඩලය සතු හන්තාන වත්තෙන් අක්කර 43ක විශාල බිම් ප්‍රමාණයක් බැහැර කර තිබීම ගැටලුකාරී බව කාරක සභාව අවධාරණය කළාය.

**07.** **කොමිෂන් සභාව පවරාගත් ඉඩමක් වෙනුවට හන්තාන - ඌරාගල වත්තෙන් අක්කර 25 ක් ලබා දීම**

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් පවරාගත් ඉඩමකට විකල්ප ඉඩමක් ලෙස කෑගල්ල දිස්ත්‍රික්කයේ පුද්ගලයකුට හන්තාන - ඌරාගල වත්තෙන් අක්කර 25ක් ලබා දී තිබූ බවත්, එම පුද්ගලයා ඉඩම ඇටෝර්නි බලපත්‍රයක් මඟින් තවත් පුද්ගලයකුට පවරා ඇති බවත්, අවසානයේ එය හෝම් ලැන්ඩ්ස් නම් ඉඩම් විකිණීමේ සමාගමකට පවරා ඇති බවත් කාරක සභාව නිරීක්ෂණය කළාය.

2021.07.31 දින ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් මෙම අක්කර 25, රු. 101,109 කට (පර්චසයක් රු. 28.72 බැගින්) සමාගමට ඔප්පුවකින් ලබා දී තිබූ බව කාරක සභාව නිරීක්ෂණය කළාය. එම සමාගම මේ වන විට අදාළ ඉඩම පර්චසයක් රු. ලක්ෂ 6 කට අලෙවි කරමින් රුපියල් බිලියන 2.2 ක ආදායමක් උපයන බවත්, මුල් ඉඩම් හිමිකරුට කිසිදු ප්‍රතිලාභයක් අත්වී නොමැති බවත්, මෙය සම්පූර්ණයෙන්ම වැරදිසහගත ගනුදෙනුවක් බවත් කාරක සභාව පෙන්වා දුන්නාය.

මෙම ගනුදෙනුව අවලංගු කිරීමට ජනාධිපති ලේකම් දැනුම් දී තිබුණද, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් ඊට පියවර ගෙන නොතිබුණි. විකල්ප ඉඩම පැවරීමට පෙර අදාළ ඉඩමේ අයිතිය පිළිබඳව නිසි තහවුරුවක් කර නොතිබීම මෙහි ප්‍රධාන ගැටලුවක් ලෙස කාරක සභාව නිරීක්ෂණය කළාය.

එසේම, මෙම ඉඩම ජනතා වතු සංවර්ධන මණ්ඩලයට පවරා දී තිබියදී ද ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් ඔප්පුව ලබා දී ඇත. එම මණ්ඩලය විරෝධය පෑමෙන් පසු කොමිෂන් සභාව විසින් ඔප්පුව අවලංගු කිරීමට තීරණය කර ඇත. කෙසේ වුවද සින්නක්කර ඔප්පුවක් අවලංගු කළ හැක්කේ දිසා අධිකරණයේ නඩුවක් ගොනු කිරීමෙන් පමණක් බව හිටපු සභාපතිවරයා පවසා සිටියේය. නමුත්, මේ සම්බන්ධයෙන් නඩු පැවරීමට කොමිෂන් සභාව මෙතෙක් කටයුතු කර නොමැති බවත්, කාරක සභාව නිරීක්ෂණය කළාය.

මෙම සියලු කරුණු දීර්ඝව සාකච්ඡා කළ කාරක සභාව, ඉඩම්වල භුක්තිය නිරවුල් කර නොගෙන පුද්ගලයින්ට ඉඩම් පැවරීම තුළින් විකල්ප ඉඩම් හිමිකම ඉල්ලීමට අවස්ථාව උදා කර ඇති කර බවත්, සින්නක්කර ඔප්පුවක් අවලංගු කළ නොහැකි බව දැන දැනම ඒ සම්බන්ධයෙන් කොමිෂන් සභා අනුමැතියක් ලබා දී ඇති බවත්,

ඉන් ඔබ්බට එම වරද නිවැරදි කිරීමට කොමිෂන් සභාව කිසිදු පියවරක් නොගෙන වගකීම් විරහිතව කටයුතු කර ඇති බවත්, අවධාරණය කළාය.

<u>කාරක සභාවේ නිර්දේශ</u>

**I. මෙම අවිධිමත් පැවරීම පිළිබඳව විධිමත් පරීක්ෂණයක් සිදු කර, වගකිව යුතු නිලධාරින් හඳුනාගෙන එම නිලධාරින්ට එරෙහිව විනය පියවර ගැනීම.**

**08. <u>ඉඩම් ලේඛනයට අනුව බදු දී ඇති ඉඩම් ප්‍රමාණය සහ එම ඉඩම්වල සමස්ත වටිනාකම</u>**

ඉඩම් ලේඛනයට අනුව කොමිෂන් සභාව සතු මුළු ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් 156,838 ක් වූ නමුත්, 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල තක්සේරු කර තිබුණේ ඉන් හෙක්ටයාර් 2,144 ක් පමණක් වන අතර එහි වටිනාකම රු. 905,285,000 ක් ලෙස දක්වා තිබුණි.එය බදු දී ඇති මුලු ඉඩම් ප්‍රමාණයෙන් ප්‍රතිශතයක් ලෙස 1.37% කි. මෙමගින් කොමිෂන් සභාව බදු දී තිබූ ඉඩම්වල තක්සේරු වටිනාකම ගිණුම් මඟින් නිවැරදිව පිළිබිඹු නොවන බැවින් විගණනයට සමස්ත වටිනාකම තහවුරු කර ගැනීමට නොහැකි වී ඇත. ඉඩම් ලැබීම් පිළිබඳ ලේඛනය තිබුණද, ඉඩම් බැහැර කිරීම් සම්බන්ධයෙන් නිවැරදි යාවත්කාලීන ලේඛනයක් නොමැති බවත්, තවද, තක්සේරු කිරීම සඳහා සියලු ඉඩම් මැනුම් කර පිඹුරු ලබා දී නොමැති බවත් කාරක සභාව නිරීක්ෂණය කළාය.

කොමිෂන් සභාවේ හිටපු සභාපතිවරුන් දැක්වූ කරුණු අනුව, 1972-1975 කාලයේ ගැසට් පත්‍ර මඟින් දේපළ පවරා ගත්තද, නිසි මැනුම් හෝ භෞතික තහවුරු කිරීම් සිදු නොවීම, ප්‍රකාශකයින් ලබා දී තිබූ ප්‍රකාශනවල ගැටලු පැවතීම සහ තාක්ෂණික දුෂ්කරතා හේතුවෙන් ඉඩම් ලේඛනය සැකසීමේදී ගැටලු මතුවී තිබුණි. ඩිජිටල් ඉඩම් ලේඛනයක් සකස් කිරීමට කාරක සභාව නිර්දේශ කර තිබූ අතර, කොමිෂන් සභාව එය අදියර 4ක් ඔස්සේ සකස් කිරීමට පියවර ගෙන තිබුණි.

මිනින්දෝරු දෙපාර්තමේන්තුව සමඟ එක්ව ඉඩම් මැනුම් කර සිතියම්ගත කිරීමේ කටයුතු සිදුකරමින් පවතින බවත්,එය සංකීර්ණ සහ කල්ගත වන කාර්යයක් බවත් කාරක සභාවට අනාවරණය විය.ඉඩම් පවරා ගැනීමේදී නිසි මැනුම් හෝ භෞතික තහවුරු කිරීම් සිදු නොකිරීම ආයතනයේ ප්‍රධාන කාර්යභාරය නොසලකා හැරීමක් බවත්, මෙම කාර්යය කඩිනමින් අවසන් කළ යුතු බවත් කාරක සභාව පෙන්වා දෙන ලදි.

<u>කාරක සභාවේ නිර්දේශ</u>

**I. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් ඉඩම් මැනීම කඩිනමින් අවසන් කිරීම සහ බදු දී ඇති ඉඩම්වල වටිනාකම තක්සේරු කිරීම.**

**II. එම කටයුතු සඳහා අදාළ ඉඩම පිහිටි ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ සහාය ලබා ගැනීම.**

## 09. <u>ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ සේවකයන්ට ඉඩම් ලබාදීම</u>

1972 අංක 01 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 44 (ඕ) වගන්තිය පාදක කරගනිමින් කොමිෂන් සභාවේ වසර 5ක අඛණ්ඩ සේවයක් හිමි සේවකයින් 373 දෙනෙකුට පර්චස් එකක් රු.1,000/- ක වටිනාකමට පර්චස් 20 බැගින් 2009 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා ඉඩම් අක්කර 46 රූඩ් 1 පර්චස් 5.64 ක් ලබා දී තිබුණු බව නිරීක්ෂණය විය.

ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 44(ඕ) වගන්තිය ප්‍රකාරව, කොමිෂන් සභාව විසින් සේවයේ යොදවා සිටින තැනැත්තන් සඳහා අර්ථසාධක අරමුදලක් පිහිටුවීම, සුබසාධන හා විනෝද ක්‍රීඩා පහසුකම් සහ නිවාස, නේවාසිකාගාර හා වෙනත් ඉඩකඩ සැපයීම සිදු කළ යුතු බව සඳහන් වන නමුදු පනතේ "වෙනත් ඉඩකඩ" යන්නෙන් ඉඩම් කැබලි ලබා දීම අදහස් නොවන බවත්, එය නිල නිවාස ව්‍යාපෘති හෝ පොදු පහසුකම් සඳහා විය යුතු බවත්, එය පනතේ අරමුණු අවභාවිතා කිරීමක් බවත් කාරක සභාව අවධාරණය කළාය.

මෙලෙස ඉඩම් ලබා දීම මේ වන විට නතර කර ඇති බවත්, පූර්වයෙන් ඉඩම් නොලත් සේවකයින් මේ වන විටත් ඉඩම් ලබා දෙන ලෙස ඉල්ලීම් සිදු කරන බවත් කාරක සභාවට අනාවරණය විය.

<u>කාරක සභාවේ නිර්දේශ</u>

**I. 1972 අංක 01 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා පනතේ 44 (ඕ) වගන්තියේ දැක්වෙන ප්‍රතිපාදන අනුව කොමිෂන් සභාවේ වසර 5ක අඛණ්ඩ සේවයක් හිමි සේවකයින් හට ඉඩම් ලබා දීමේ හැකියාවක් පවතින්නේ ද යන්න පිළිබඳව නීතිපතිවරයාගෙන් කඩිනමින් උපදෙස් ලබා ගැනීම.**

**II. නීතිපතිවරයාගෙන් ලැබෙන උපදෙස් පරිදි අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කිරීම.**

## 10. <u>ඉඩම් ලේඛනය සකස් කිරීම</u>

1972 අංක 01 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා පනත අනුව 1975 වසර දක්වා අක්කර මිලියන 1.8 ක් අත්පත් කර ගෙන ඇති නමුත්, නිවැරදි දැක්මක් සහ සැලැස්මක් නොතිබීම තුළ කොමිෂන් සභාවට අයත් ඉඩම් පිළිබඳ ලේඛනයක් සකස් කිරීමට නොහැකි වී තිබුණි. එලෙස ඉඩම් ලේඛනයක් සකස් කිරීමට පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් ලබා දී තිබූ නිර්දේශය පරිදි කටයුතු ආරම්භ කර තිබූ ඉඩම් ලේඛනය සැකසීමේ කාර්යය අවසන් කොට ඇති බව කාරක සභාවට අනාවරණය විය.

## 11. <u>එස්.ආර්.රෙන්ගනාදන් මහතාට ඉඩම් ලබාදීම (මාතලේ බේගෲප් වත්ත)</u>

මාතලේ බේගෲප් වත්තට අදාළව ඉඩම් ප්‍රකාශ කර තිබූ එස්. රෙන්ගනාදන් මහතාට 1975 වසරේදී ගැසට් පත්‍ර මඟින් අක්කර 50ක් ව්‍යවස්ථාපිත නිශ්චය ලෙස හිමිකර දී තිබුණි. නමුත්, මෙම ඉඩම වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට වෙන් කර ඇති බව පවසමින් ඔහු විකල්ප ඉඩමක් ඉල්ලා තිබුණි. ඒ අනුව, 1982 වසරේදී ගැසට් පත්‍රයක් මඟින් අක්කර 25යි පර්චස් 19ක්, අක්කර 6ක් සහ අක්කර 18ක් වශයෙන් ඉඩම් කැබලි තුනක් ඔහුට ලබා දී තිබුණි.

නැවත ඉල්ලීම් කිරීම් අනුව, 1987 වසරේදී භුවමාරු ඔප්පුවක් මඟින් අක්කර 32 රූඩ් 02 පර්චස් 30ක් ඔහුට පවරා තිබුණි. මෙම අවස්ථාවේදී, රුපියල් 17,000ක තක්සේරු වෙනස ද අය නොකර ඉඩම ලබා දීමට කොමිෂන් සභාව තීරණය කර තිබුණි. මෙම අක්කර 50ම නකල්ස් රක්ෂිතයට පවරා ගෙන ඇතැයි පවසමින් රෙන්ගනාදන් මහතා නැවත විකල්ප ඉඩමක් ඉල්ලා තිබුණි. ඊට අදාළව, කඩුවෙල පිහිටි ගනේමුල්ල කුඹුර නැමැති ඉඩමෙන් අක්කර 25ක් භුවමාරු ඔප්පුවක් මත ලබා දීම අනුමත කොට ඉන් අක්කර 11ක් ලබා දී තිබුණි. එම ඉඩමේ වටිනාකම රුපියල් කෝටි 350ක් වූ බව කාරක සභාවට අනාවරණය විය.

මෙම ගනුදෙනු පිළිබඳව ගැටලු ගණනාවක් මතු විය. එනම්, රෙන්ගනාදන් මහතාට 1987 දී ලබා දුන් අක්කර 32ක ඉඩම් කොටස ඔහු විසින් 1997 වසරේදී විකුණා තිබියදී කොමිෂන් සභාව නැවත නැවතත් රජයේ වටිනා ඉඩම් ඔහුට ලබා දී තිබුණි. එසේම, ලග්ගල ප්‍රාදේශීය ලේකම්වරයා තහවුරු කර තිබුණේ එම ඉඩම් රජය මඟින් අත්පත් කරගෙන නොතිබුණ බවයි. එසේ වුවද, ලග්ගල වැනි දුෂ්කර ප්‍රදේශවලින් ප්‍රකාශ කළ ඉඩම වෙනුවෙන් කොළඹ වැනි ජනාකීර්ණ, මිල අධික ප්‍රදේශවලින් ඉඩම් ලබා දීමට කටයුතු කර තිබුණි. තවදුරටත්, අදාළ භුවමාරු ඔප්පුවේ යොදා තිබූ අත්සන පවා රෙන්ගනාදන් මහතාගේ මුල් අත්සන් සමඟ නොගැලපෙන බව ද නිරීක්ෂණය විය.

අවසානයේදී, රෙන්ගනාදන් මහතාට ලබා දී තිබූ අක්කර 32ක ඉඩම් කොටස විකුණා ඇති බව තහවුරු වීමෙන් පසු, විකල්ප වශයෙන් ලබා දීමට තීරණය කර තිබූ අක්කර 25ක ප්‍රමාණය අක්කර 18කට සීමා කර සංශෝධන කිරීමට තීරණය කර තිබුණි. මෙම ගනුදෙනුවලදී නිලධාරින් ඉතාම අපරීක්ෂාකාරීව සහ වගකීම් විරහිතව කටයුතු කර තිබූ බව කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලදී. මෙය රාජ්‍ය දේපළවලට සිදු වූ බිහිසුණු අපරාධයක් බවත්, මෙවැනි කටයුතු නැවත සිදු නොවිය යුතු බවත් කාරක සභාව අවධාරණය කළාය.

<u>කාරක සභාවේ නිර්දේශ</u>

**I. මේ පිළිබඳව විධිමත් පරීක්ෂණයක් සිදු කර, වගකිව යුතු නිලධාරින් හඳුනාගෙන එම නිලධාරින්ට එරෙහිව නීතිමය සහ විනය පියවර ගැනීම.**

**12. <u>මාලනී නානායක්කාර මහත්මියට ඉඩම් ලබාදීම (ඉඹුල්ගස්වාඩිය, කටාන)</u>**

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් ගම්පහ දිස්ත්‍රික්කයේ පිහිටි හෙක්ටයාර් 28.52ක ඉඹුල්ගස්වාඩිය නමැති වටිනා ඉඩම ජනතා වතු සංවර්ධන මණ්ඩලයට (ජනවසම) පවරා දී තිබුණි. ජනවසම විසින් 1992 වසරේ සිට වසර 53ක දීර්ඝ කාලීන බදු පදනම මත මෙම ඉඩම හලාවත වැවිලි සමාගම වෙත පවරා දී තිබුණි. මෙම ඉඩමෙන් අක්කර 25ක්, කොමිෂන් සභාව විසින් 2021 අගෝස්තු 05 දිනැති ගැසට් පත්‍රයක් මඟින් නැවත පවරා ගෙන ඇත. **එය ඉඩම් ප්‍රකාශ කළ තැනැත්තෙකුගේ මුණුබුරන් දෙදෙනෙකු** වෙත විකල්ප ඉඩම් පැවරීම යටතේ පවරා දී තිබුණි.

මෙලෙස මුණුබුරන්ට ඉඩම් පැවරීමට කොමිෂන් සභා පනතේ කිසිදු ප්‍රතිපාදනයක් නොතිබුණද, කොමිෂන් සභාව විසින් කටානේ ඉඹුල්ගස්වාඩිය ඉඩමෙන් අක්කර 28.5ක් පමණ ලබා දීමට අනුමැතිය ලබා දී තිබුණි. මෙම පැවරීම සම්බන්ධයෙන් ජනාධිපති ලේකම්වරයාගේ සහ ඉඩම් අමාත්‍යාංශ ලේකම්වරයා විසින් දක්වන විරෝධතාවද නොසලකා හැර ඇති බව ද නිරීක්ෂණය විය. පුද්ගලයන්ට ඉඩම් පැවරීම අනුමත නොකරන බව මුදල් අමාත්‍යාංශයේ ලේකම් සහ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින්ද ලිඛිතව ප්‍රකාශ කර තිබියදීත්, අතිවිශේෂ ගැසට් පත්‍රයක් මඟින් මෙම ඉඩම ලබා දී තිබුණි.

මෙම ගනුදෙනුවේදී, ඉතා දුර බැහැර ප්‍රදේශවලින් ප්‍රකාශ කළ නොබෙදූ ඉඩම් වෙනුවට මිල අධික, ජනාකීර්ණ ප්‍රදේශවලින් ඉඩම් ලබා දී තිබුණි. 2021 ඔක්තෝබර් 07 දින ඉඩම් අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් එම ගැසට් පත්‍රය අවලංගු කිරීමට නියෝග කළද, එය ක්‍රියාත්මක වී නොතිබුණි. මෙම ඉඩම මේ වන විට කැබලි කොට ඉහළ මිල ගණන්වලට විකුණමින් සිටින බවට කාරක සභාවට අනාවරණය විය.

මෙලෙස වටිනා රාජ්‍ය ඉඩම් දේශපාලන බලපෑම් මත කිසිදු නීත්‍යානුකූල පදනමකින් තොරව ලබා දීම බරපතල වරදක් බව කාරක සභාව අවධාරණය කළාය.

**13. <u>"උරුමය" වැඩසටහන යටතේ ඔප්පු ප්‍රදානය සහ ඒ සඳහා වියදම්</u>**

රජයේ උරුමය ඔප්පු ප්‍රදානෝත්සවයට සමගාමීව 'සැමට හිමි බිමක්' යන තේමාව යටතේ ඔප්පු ප්‍රදානෝත්සවය 2024 මාර්තු 30 දින මහනුවර බෝගම්බර ක්‍රීඩාංගනයේදී පවත්වා තිබුණි. මෙම උත්සවයේදී ඔප්පුලාභීන් 2,700 කට ඔප්පු ගබා දීම සඳහා කොමිෂන් සභා අනුමැතියක් පමණක් පදනම් කරගෙන රු.10,106,150 ක වියදමක් දරා ඇති බව කාරක සභාව නිරීක්ෂණය කළාය.

## 14. <u>වාල්ස් නෙවිල් උදලාගම මහතාට ඉඩම් ලබාදීම (මාතලේ කෝන්ගස්යාය)</u>

1972 අංක 01 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා පනත අනුව වාල්ස් නෙවිල් උදලාගම නැමැති පුද්ගලයා විසින් අක්කර 64 රූඩ් 0 පර්චස් 01ක් ප්‍රකාශ කර තිබූ අතර, ඔහුට ව්‍යවස්ථාපිත නිශ්චය යටතේ 1988 ජුනි 21 දිනැති ගැසට් පත්‍රයකින් මාතලේ දිස්ත්‍රික්කයේ ස්ථාන දෙකකින් අක්කර 50ක් වෙන් කර තිබුණි. මෙම ඉඩම්වල අනවසර පදිංචිකරුවන් සිටින බව ප්‍රකාශ කරමින් ඔහු නොයෙක් අවස්ථාවල විකල්ප ඉඩම් ඉල්ලා තිබුණි. ඔහු විසින් 2010 ජුනි 22 දිනැති ඇටෝර්නි බලපත්‍රයක් මඟින් ඉඩම් හුවමාරු කටයුතු සඳහා ජයම්පති පරාක්‍රම අලුවිහාරේ නැමැති අයව සිය ඇටෝර්නි බලකරු ලෙස පත් කර තිබුණි. ගැසට් කර තිබූ කෝන්ගස් යාය නමැති ඉඩමෙන් කොටසක් වෙනුවට විකල්ප ලෙස, ඇටෝර්නි බලකරුට බදු පදනම මත ලබා දීමට තීරණය කර තිබූ උඩවෙල වත්තේ අක්කර 24 රූඩ් 02 පර්චස් 07ක ප්‍රමාණය තක්සේරු වටිනාකම් අතර වෙනස අය කර ලබා දීමට 2023 සැප්තැම්බර් 06 දින කොමිෂන් සභාව තීරණය කර තිබුණි. කාරක සභාව නිරීක්ෂණය කළේ, උදලාගම මහතාට ගැසට් පත්‍රය මඟින් ලබා දී තිබූ ඉඩම, ඔහු විසින් 2010 ජුනි 22 දින ඇටෝර්නි බලකරුට විකුණා තිබූ බවයි. ගැසට් පත්‍රය මඟින් ඉඩම් ලබා දී තිබියදී එම ඉඩම් පවරා නොගෙන, ඔහුට නැවත ඉඩම් ලබා දීමට කොමිෂන් සභාව කටයුතු කර තිබුණි.

විකල්ප ලෙස ලබා දීමට තීරණය කරන ලද ඉඩම වෙනුවෙන් තක්සේරු ගාස්තු ගෙවන ලෙස ඉඩම් (උපරිම සීමා) නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා කළ දැනුම් දීමකට අනුව, උදලාගම මහතා විසින් 2024 ජූලි 30 දිනැති රිසිට් පත්‍රයක් මඟින් මුදල් ගෙවා ඇති බව සඳහන් වුවද, 2018 මාර්තු 23 දිනැති මරණ සහතිකය අනුව උදලාගම මහතා ඒ වන විට ජීවතුන් අතර නොසිටි බව කාරක සභාවට අනාවරණය විය..

වාල්ස් නෙවිල් උදලාගම මහතා 2018 මාර්තු 23 දින මියගොස් සිටියදීත්, ඔහු අත්සන් කළ ඇටෝර්නි බලපත්‍රය 2023 මාර්තු 10 දින අවලංගු කර ඇති අතර, ඔහු නමින් දිවුරුම් ප්‍රකාශද ලබා දී තිබූ බව වැඩිදුරටත් නිරීක්ෂණය විය. 2023 දෙසැම්බර් 14 දින ඔහු විසින් විකල්ප ඉඩමක් ඉල්ලා ලිපියක් යොමු කර ඇති බවටත්, 2024 දී කොමිෂන් සභාව විසින් එම ඉල්ලීම අනුමත කර තිබීම බරපතල ගැටලුවක් බව කාරක සභාව අවධාරණය කළාය. මියගිය පුද්ගලයෙකුගේ නමින් ගනුදෙනු සිදු කිරීම බරපතල වංචාවක් හා අපරාධයක් බවත්, කොමිෂන් සභාවේ නිලධාරීන් දැනුවත්ව හෝ නොදැනුවත්ව මෙම වංචාවට හවුල් වී ඇති බවත් කාරක සභාව වැඩිදුරටත් නිරීක්ෂණය කළාය.

නියෝජ්‍ය අමාත්‍ය කාර්යාලයට මේ පිළිබඳව පැමිණිල්ලක් ලැබී ඇති බවත්, ඒ පිළිබඳව පරීක්ෂණයක් පැවැත්වීම සඳහා කොමිෂන් සභාවට යොමු කර ඇති බවත් කාරක සභාවට අනාවරණය විය. ඒ අනුව, මූලික විමර්ශනයක් බාහිර විමර්ශන නිලධාරියෙකු විසින් පවත්වන බවත් කාරක සභාවට අනාවරණය විය.

<u>කාරක සභාවේ නිර්දේශ</u>

**I. මෙ සම්බන්ධව සිදු කරමින් පවතින පරීක්ෂණ කටයුතු කඩිනමින් අවසන් කිරීම.**

**II.** **මෙම සිදුවීමට අදාළ ලේඛනවල ආරක්ෂාව සඳහා ගත යුතු සියලු පියවර කඩිනමින් ගැනීම.**

**15. <u>ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් ඉඩම් ගැසට් පත්‍ර මඟින් වෙනත් ආයතන වෙත පැවරීම සහ ඉන් පසු එම ඉඩම්වල අයිතිය සම්බන්ධයෙන් පැන නැඟී ඇති ගැටලු</u>**

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට (LRC) පවරා ගත් ඉඩම්, පසුකාලීනව ජනතා වතු සංවර්ධන මණ්ඩලයට (JEDB) සහ රාජ්‍ය වැවිලි සංස්ථාවට (SPC) කළමනාකරණය සඳහා ගැසට් පත්‍ර මඟින් කොන්දේසි සහිතව ලබා දී තිබුණි. මෙම ආයතන විසින් එම ඉඩම් නැවත ප්‍රාදේශීය වතු සමාගම් (RPC) 23කට ලබා දී ඇති අතර, ඉන් එක් සමාගමක් වූයේ බලංගොඩ වැවිලි සමාගමයි. ගැසට් පත්‍රවල ඉඩම් "පැවරීම" (vested) ලෙස සඳහන් වී තිබීම හේතුවෙන්, ජනතා වතු සංවර්ධන මණ්ඩලය සහ රාජ්‍ය වැවිලි සංස්ථාව මෙන්ම ප්‍රාදේශීය වතු සමාගම්ද එම ඉඩම්වල පරම අයිතිය තමන් සතු බවට තර්ක කරන බව කාරක සභාවට නිරීක්ෂණය විය.

කෙසේ වෙතත්, කාරක සභාව හමුවේ අනාවරණය වූයේ, 1972 අංක 11 දරන රාජ්‍ය කෘෂිකාර්මික නීතිගත සංස්ථා පනතින් ජනතා වතු සංවර්ධන මණ්ඩලය පිහිටුවා තිබුණේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු ඉඩම් පරිපාලනය කිරීමේ අරමුණින් බවයි. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා පනතේ 6 වන වගන්තිය අනුව, කෘෂිකාර්මික ඉඩම් කොමිෂන් සභාව සතු වූ අවස්ථාවක දී ඒ සතුවීමේ දින සිට එහි පරම අයිතිය බැඳීම්වලින් තොරව ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත හිමි වූ අතර, 1981 අංක 39 දරන පනතේ 27 (අ) (4) උපවගන්තිය මඟින් නියමයන් කඩ වූ විට ඉඩම් නැවත ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු කිරීමට විෂය භාර ඇමතිවරයාට බලය තිබුණි. මෙමඟින් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු නෛතික අයිතිය ව්‍යවස්ථාමය වශයෙන් තහවුරු වී තිබුණි.

මෙම ඉඩම් කළමනාකරණය සඳහා කොන්දේසි සහිතව පවරා දී ඇති නමුත්, නෛතික අයිතිය ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතුව පැවතිය බවත්, එසේ වුවද අධිකරණයට පවා මෙම ඉඩම්වල අයිතිය තහවුරු කර ගැනීමට නොහැකි වූ බැවින් දක්ෂිණ අධිවේගී මාර්ගයට ඉඩම් අත්පත් කර ගැනීම සම්බන්ධයෙන් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට හිමි විය යුතු රුපියල් බිලියන 05කට අධික වන්දි මුදලක් අධිකරණයේ තැන්පත් කර තිබෙන බව අනාවරණය විය. මීට අමතරව, ප්‍රාදේශීය වැවිලි සමාගම් මෙම ඉඩම්වල අනවසර මැණික් ගැරීම් ඇතුළු නොයෙකුත් ව්‍යාපාරික කටයුතු හා කොටස් වෙළෙඳපොළ ආයෝජන කටයුතු සිදු කරමින් සිටි බවත්, මෙම ගැටලුව පාර්ශ්ව කිහිපයක් අතර පවතින සංකීර්ණ තත්ත්වයක් බවත් තවදුරටත් අනාවරණය විය.

ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතුවල දී ප්‍රාදේශීය ලේකම්වරුන්ට ඉඩම්වල අයිතිය නිශ්චිතව කිව නොහැකි අවස්ථාවල අධිකරණයට යොමු කරන බැවින්, අධිකරණවලට ද තීන්දුවක් ලබා දිය නොහැකි වීම හේතුවෙන් විශාල නඩු ප්‍රමාණයක් එකතු වී ඇත. එමෙන්ම, මෙම ගැටලුව හේතුවෙන් ඉඩම් ප්‍රතිසංස්කරණ

කොමිෂන් සභාව විසින් පෞද්ගලික නීතිඥවරුන්ට විශාල මුදලක් වැය කරමින් නඩු කටයුතු 600කට ආසන්න ප්‍රමාණයක් පවත්වාගෙන යන බව කාරක සභාවට අනාවරණය විය. කඩිනමින් මෙම ගැටලුව නිරාකරණය කළ යුතු බව කාරක සභාව අවධාරණය කළාය

මෙම ඉඩම්වල පරම අයිතිය සම්බන්ධයෙන් පහත දක්වා ඇති පරිදි ආයතන අතර මතභේදාත්මක තත්ත්වයක් උද්ගතව ඇති බව කාරක සභාව හමුවේ අනාවරණය විය.

| ආයතනය | අදාළ ඉඩම් හිමිකාරත්වය සම්බන්ධ මතය |
|---|---|
| ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව | ජනතා වතු සංවර්ධන මණ්ඩලයට සහ රාජ්‍ය වැවිලි සංස්ථාවට ඉඩම් කළමනාකරණය සඳහා ගැසට් පත්‍ර මඟින් කොන්දේසි සහිතව පවරා ඇති බවත්, එම ඉඩම්වල නෛතික අයිතිය කොමිෂන් සභාව සතු විය යුතු බව |
| ජනතා වතු සංවර්ධන මණ්ඩලය සහ රාජ්‍ය වැවිලි සංස්ථාව | ගැසට් පත්‍රවල "පැවරීම" (vested) යන වචනය භාවිතා කිරීම නිසා ජනතා වතු සංවර්ධන මණ්ඩලය සහ රාජ්‍ය වැවිලි සංස්ථාව තමන්ට පරම අයිතිය ලැබුණු බව |
| වැවිලි සමාගම් 23 | ජනතා වතු සංවර්ධන මණ්ඩලය සහ රාජ්‍ය වැවිලි සංස්ථාව ඉඩම් ඔවුන්ට පවරා ඇති බැවින් සහ ඔවුන් එම ඉඩම් ලබා ගෙන ඇත්තේ මහා භාණ්ඩාගාරය මඟින් බැවින් එම ඉඩම්වල පරම අයිතිය ඔවුන්ට ලැබුණු බව |

මෙම ගැටලුව සම්බන්ධයෙන් දීර්ඝ වශයෙන් සාකච්ඡා කළ කාරක සභාව පහත නිර්දේශ ඉදිරිපත් කළාය.

<u>කාරක සභාවේ නිර්දේශ</u>

**I.** **ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් ඉඩම් වෙනත් ආයතන වෙත පැවරීම සහ ඉන් පසු එම ඉඩම්වල අයිතිය සම්බන්ධයෙන් පැන නැඟී ඇති නීතිමය ගැටලු සම්බන්ධව නීති උපදෙස් ලබා ගැනීම අවශ්‍ය වන්නේ නම් නව නීති සම්පාදනයකට යොමු වී හෝ මෙම ගැටලු නිරාකරණය කිරීමට අදාළ සියලු ක්‍රියාමාර්ග ගැනීම.**

**II.** **මෙම ගැටලුව හේතුවෙන් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අදාළව අධිකරණයේ පවතින නඩු ප්‍රමාණය, වාරණ නියෝග ප්‍රමාණය, අධිකරණයේ තැන්පත් කර ඇති වන්දි මුදල් ප්‍රමාණය පිළිබඳවද**

**තොරතුරු සහ මෙම ගැටලු විසඳීමට අදාළ යෝජනා, නිර්දේශ ඇතුළත් කර අමාත්‍ය මණ්ඩලයට සංදේශයක් ඉදිරිපත් කිරීම.**

## 16. <u>විකල්ප ඉඩම් ලබා දීමේ බලතල සහ ක්‍රියාපටිපාටිය</u>

| | |
|---|---|
| නීතිමය කරුණ | ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ (නීති) විසින් සිදු කළ කරුණු දැක්වීම අනුව නිරීක්ෂණය වූ කරුණු |
| **ඉඩම් හුවමාරු කිරීමේ බලය** | 1972 අංක 01 දරන පනතේ 22(1)(අ) සහ 44(අ) වගන්ති යටතේ කොමිෂන් සභාවට ඉඩම් "හුවමාරු කිරීමට" බලය ඇති බව, |
| **විකල්ප ඉඩම් පැවරීමේ භාවිතය** | ව්‍යවස්ථාපිත නිශ්චය නැවත වෙනස් කිරීමට සෘජු ප්‍රතිපාදන නොතිබුණද, වෙන් කළ ඉඩම භුක්ති විඳීමට නොහැකි වූ විට කොමිෂන් සභාවේ අභිමතය පරිදි හුවමාරු කිරීමේ භාවිතයක් අනුගමනය කර තිබූ බව, |
| **අභිමත බලයේ සීමාව** | මෙම අභිමත බලය පනතේ අරමුණුවලින් බැහැරව භාවිතා කළ නොහැකි බව, |
| **පවුල් තුළ පැවරීමේ සීමාව** | පනත යටතේ ප්‍රකාශකයෙකුට අක්කර 50ක්, (ව්‍යවස්ථාපිත නිශ්චය) දෙමාපියන්ට සහ 18ට වැඩි දරුවන්ට පවුල් තුළ පැවරුම් ලෙස උපරිම ඉඩම් ප්‍රමාණය අක්කර 150ක් බව, අනතුරුව පවුලකට හිමි විය යුතු උපරිම සීමාව අක්කර 200ක් වූ බව, |
| **මුණුබුරන්ට පැවරීම** | පරම්පරා ගණනක් ගත වූ පසු මුණුබුරන්ට විකල්ප ඉඩම් ලබා දීමට පනතේ ප්‍රතිපාදන නොමැති බව, |

1972 අංක 01 දරන පනතේ 44(අ) වගන්තිය යටතේ කොමිෂන් සභාවට විකල්ප ඉඩම් ලබා දීමට බලය ඇති බවත්, ඊට "හුවමාරු කිරීමට" පවතින බලය අදාළ බවත්, ඒ සඳහා නිශ්චිත ක්‍රමවේදයක් නොතිබුණ බැවින්, කොමිෂන් සභාව අවස්ථානෝචිතව තීරණ ගත් බවටත් කාරක සභාවට කරුණු ඉදිරිපත් විය.

ප්‍රකාශකයෙකුට ව්‍යවස්ථාපිත නිශ්චය ලෙස වෙන් කළ ඉඩම් කොටස තුළ අනවසර පදිංචිකරුවන් සිටීම, රක්ෂිතයක් ලෙස රජය විසින් අත්පත් කර ගැනීම හෝ වෙනත් හේතූන් මත ඉඩමේ භුක්තිය හිමිකරුට ලබා ගැනීමට නොහැකි වූ විට, ව්‍යවස්ථාපිත නිශ්චය නැවත වෙනස් කිරීමට හෝ ඒ වෙනුවට වෙනත් ඉඩමක් ලබා දීමට පනතේ සෘජු ප්‍රතිපාදන නොතිබුණද, පුද්ගලයන්ට එවැනි අසාධාරණයක් වූ අවස්ථාවලදී ඉඩම් හුවමාරු කිරීමේ භාවිතයක් අනුගමනය කර තිබුණ බව කාරක සභාව නිරීක්ෂණය කළාය. කෙසේ වෙතත්, මෙම භාවිතය සමහර අවස්ථාවලදී අවභාවිතා වී ඇති බවටද නිරීක්ෂණය විය.

**<u>කාරක සභාවේ නිර්දේශ</u>**

I. **ව්‍යවස්ථාපිත නිශ්වය සඳහා විකල්ප ඉඩම් ලබා දීමේ දී සිදු වී ඇති අවිධිමත් තත්ත්ව සියල්ල සලකා බැලීම.**

II. **ව්‍යවස්ථාපිත නිශ්වය සඳහා විකල්ප ඉඩම් ලබා දීම තවදුරටත් සිදු කළ යුතුද යන්න සලකා බැලීම සහ තවදුරටත් එසේ සිදු කළ යුතු නම් ඒ සඳහා අනුගමනය කළ යුතු විධිමත් ක්‍රමවේදයක් සකස් කිරීම.**

**17. <u>නියාගම වෘත්තීය පුහුණු අධිකාරියට විකුණා පවරා දීමට එකඟ වී තිබූ ඉඩමක් ලක්ෂ්මන් නානායක්කාර මහතාට ලබා දීමට නඩුවක දී එකඟතාවය පළ කිරීම</u>**

බෙන්තොට, වලල්ලාවිට කෝරලයේ ගාල්ල නියාගම ප්‍රදේශයේ පිහිටි අක්කර 13 රූඩ් 03 පර්චස් 39.7ක ඉඩමක් නියාගම වෘත්තීය පුහුණු අධිකාරියට (VTA) විකිණීමෙන් පැවරීමට 2010 වසරේදී තීරණය කර තිබුණි. ඒ සඳහා අධිකාරිය විසින් රුපියල් 3,013,511ක් ගෙවා ඇති අතර ඔප්පුව ලබා ගැනීම සඳහා 2013 වසරේ සිට 2022 දක්වා ලිපි ගණනාවක් කොමිෂන් සභාව වෙත යොමු කර තිබුණද, මේ දක්වාම එම ඉඩම සඳහා ඔප්පුව වෘත්තීය පුහුණු අධිකාරියට ලබා දී නොතිබුණි.

මේ අතරතුර, වාල්ස් නානායක්කාර මහතාගේ ව්‍යවස්ථාපිත නිශ්වය නිශ්චිතව මැන හෝ ගැසට් කර සම්පූර්ණ වී නොතිබුණද, ඔහුගේ දරුවෙකු වන ලක්ෂ්මන් නානායක්කාර මහතාට අක්කර 25ක ප්‍රමාණයක් විකල්ප ලෙස ලබා දීමට ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව 2005 දී තීරණය කර තිබුණි. වෘත්තීය පුහුණු අධිකාරියට වෙන් කළ 'ගල්ලිඳවත්ත' ඉඩම අවශ්‍ය බවට ලක්ෂ්මන් නානායක්කාර මහතා ඉල්ලීමක් කර ඇති අතර, එම ඉඩමෙන් අක්කර 3ක ප්‍රමාණයක් ඔහුට ලබා දීමට ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව අනුමැතිය ලබා දී තිබුණි.

වෘත්තීය පුහුණු අධිකාරියට ඉඩමේ අයිතිය පවරා නොතිබූ මෙම කාල සීමාව තුළ, ලක්ෂ්මන් නානායක්කාර මහතා විසින් කොමිෂන් සභාවට එරෙහිව රිට් පෙත්සමක් (CA Writ 100/2020) ගොනු කර තිබුණි. මෙම නඩුව සමථයකට පත් කර ගන්නා ලෙසට ඉඩම් අමාත්‍යාංශයේ ලේකම්වරයා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට උපදෙස් ලබා දී තිබුණි. ඒ අනුව, වෘත්තීය පුහුණු අධිකාරිය විසින් හිමිකම ඉල්ලා සිටි ඉඩම් කොටසින් අක්කර 03ක ප්‍රමාණයක් ලක්ෂ්මන් නානායක්කාර මහතාට ලබා දීමට අධිකරණයේදී දෙපාර්ශවය එකඟතාවයකට පැමිණ තිබුණි.

නඩු කටයුත්තකට අදාළව නීතිපතිවරයාගේ උපදෙස් මත කොමිෂන් සභාව ක්‍රියාත්මක විය යුතු බව පෙන්වා දුන් කාරක සභාව, අමාත්‍යාංශ ලේකම්වරයා විසින් එසේ එකඟතාවයකට එළැඹීමට උපදෙස් දීම සහ එය ක්‍රියාත්මක කිරීම තුළින් නියාගම වෘත්තීය පුහුණු අධිකාරියේ හිමිකම් නොසලකා හැර ඇති බව නිරීක්ෂණය කළාය.

**18. <u>ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට විගණකාධිපතිවරයා විසින් 2022 සහ 2023 වර්ෂවලට අදාළව ඉදිරිපත් කර ඇති විගණන නිරීක්ෂණ</u>**

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට විගණකාධිපතිවරයා විසින් 2022 සහ 2023 වර්ෂවලට අදාළව ඉදිරිපත් කර ඇති විගණන නිරීක්ෂණ සම්බන්ධයෙන් 2025.05.15 දින සහ 2025.07.17 වැනි දිනවල දී කාරක සභා රැස්වීම්වලදී සාකච්ඡාවට ලක් කිරීමට හැකි වූ කරුණුවලට අදාළව, කාරක සභාව ලබා දුන් නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු බවත්, සාකච්ඡාවට ලක් කිරීමට නොහැකි වූ සියලුම කරුණු පිළිබඳව ද විධිමත්ව පරීක්ෂණ පැවැත්විය යුතු බවත් කාරක සභාව අවධාරණය කළාය.

<u>කාරක සභාවේ නිර්දේශ</u>

**I. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට විගණකාධිපතිවරයා විසින් 2022 සහ 2023 වර්ෂවලට අදාළව ඉදිරිපත් කර ඇති විගණන නිරීක්ෂණ සම්බන්ධයෙන් 2025.05.15 දින සහ 2025.07.17 වැනි දිනවල දී කාරක සභා රැස්වීමේ දී සාකච්ඡාවට ලක් කිරීමට හැකි වූ කරුණුවලට අදාළව, කාරක සභාව ලබා දුන් නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු බවත්, සාකච්ඡාවට ලක් කිරීමට නොහැකි වූ සියලුම කරුණු පිළිබඳව ද විධිමත් පරීක්ෂණ සිදුකර අවශ්‍ය ඉදිරි කටයුතු කිරීම.**

**II. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට විගණකාධිපතිවරයා විසින් 2022 සහ 2023 වර්ෂවලට අදාළව ඉදිරිපත් කර ඇති විගණන නිරීක්ෂණ සම්බන්ධයෙන් 2025.05.15 දින සහ 2025.07.17 වැනි දිනවල දී කාරක සභා රැස්වීමේ දී සාකච්ඡාවට ලක් කිරීමට හැකි වූ කරුණුවලට අදාළව, කාරක සභාව ලබා දුන් නිර්දේශ අනුව සිදු කරන පරීක්ෂණ වාර්තා සහ ඉහත 18(I) නිර්දේශය ප්‍රකාරව සිදු කරන පරීක්ෂණ වාර්තා සියල්ල අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම.**